# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 2026 . 09 . 14

එච්.එම්.රේණුකා දමයන්ති කුමාරි
සිංහාරවත්ත, රන්වන් ගුහාව,
තිරවනාගම, හපුතලේ.

*පැමිණිලිකාර පාර්ශවය*

*එදිරිව*

1. ප්‍රධාන පොලිස් පරීක්ෂක නලීන් ජයසුන්දර
   ස්ථානාධිපති
   පොලිස් ස්ථානය, පිටකොටුව

2. පොලිස් පරීක්ෂක හපුතන්ත්‍රිගේ ක්‍රිෂාන්ත ගංගානාථ
   කාර්යභාර නිලධාරී
   පොලිස් ස්ථානය, පිටකොටුව

3. පො.කො. 34948 රක්මල්ගොඩ
   උප සේවය භාර නිලධාරී
   පොලිස් ස්ථානය, පිටකොටුව

4. පො.ප නෙවිල් ප්‍රියන්ත
   ස්ථානාධිපති- රාජකාරි ආවරණය
   පොලිස් ස්ථානය, පිටකොටුව

5. පො.ප එච්.පී.එන්. පැතුම් කුමාර
   පොලිස් ස්ථානය, පිටකොටුව

6. කා.උ.පො.ප ඒ.ඒ.සී.දමයන්ති
   පොලිස් ස්ථානය, පිටකොටුව

7. පො.කො.61051 ආර්.එම්.සී.ජේ. රාජපක්ෂ
   පොලිස් ස්ථානය, පිටකොටුව

8. පො.කො 54478 ඩී.ඒ.වසන්ත පුෂ්ප කුමාර
   පොලිස් ස්ථානය, පිටකොටුව

*වගඋත්තර පාර්ශවය*

**පැමිණිලි අංකය: HRC/SUO/MOTU/02/2018 හා HRC/285/18**


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.

සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451

ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74

ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com

දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82

ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521

ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996

වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

<u>පැමිණිල්ල -</u>

පිටකොටුව පොලිස් ස්ථානය තුළ රඳවා සිටි පුද්ගලයෙකු මියයාම සම්බන්ධයෙන් ලද තොරතුරක් පදනම් කරගනිමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිය ස්ව-මෙහෙයවීම් (Suo Motu) බලතල ප්‍රකාරව HRC/SUO/MOTU/02/18 දරන අංකය යටතේ 2018.01.11 වන දින විමර්ශනයක් ආරම්භ කර එදිනම කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් කණ්ඩායමක් පිටකොටුව පොලිස් ස්ථානය වෙත ගොස් අදාළ ප්‍රකාශ සටහන් කරගැනීමටත් ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරීමටත් පියවර ගෙන ඇති අතර අනතුරුව 2018.01.18 වන දින මියගිය තරුණයාගේ මව වන එච්.එම්. රේණුකා දමයන්ති කුමාරි මහත්මිය විසින් ද මෙම සිදුවීම සම්බන්ධයෙන් HRC/285/18 දරන අංකය යටතේ කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

මෙම සිදුවීම සම්බන්ධයෙන් 2018 ජනවාරි 12 වන සිකුරාදා දිනැති 'ලංකාදීප' පුවත්පතෙහි "*ගංජා එක්ක හසුවූ හපුතලේ තරුණයා පොලිස් කුඩුවේ දී ගෙල වැළලාගෙන*" යන ප්‍රධාන සිරස්තලය යටතේ කරුණු වාර්තා කරමින් ගංජා ග්‍රෑම් 50 ක් සමඟ අත්අඩංගුවට ගෙන පිටකොටුව පොලිස් සිරමැදිරියේ රඳවා සිටි 17 හැවිරිදි තරුණයකු 2018.01.11 දින අලුයම ඔහු ඇඳ සිටි මේසේ බැනියමෙන් ගෙල වැළලාගෙන සිටියදී කොළඹ ජාතික රෝහල වෙත ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇති බවත්, මියගොස් ඇත්තේ හපුතලේ තිරිමාගම පදිංචි පුබුදු ලක්මාල් ජයසේකර නමැති තරුණයා බවත් එම තරුණයා එදින අලුයම 1.00 ට පමණ බැස්ටියන් මාවත බස් නැවතුම්පොළේ රැඳී සිටියදී පිටකොටුව පොලිසියේ දූෂණ මර්දන ඒකකයේ නිලධාරීන් විසින් සැකපිට පරීක්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබී ගංජා මිලිග්‍රෑම් 50 ක ප්‍රමාණයක් සොයාගෙන ඇති බවත් ඔහු සිය නැන්දා බැලීමට කොළඹට පැමිණ යළි ගමට යාමට පැමිණි බව ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇති අතර මොහු සමඟ තවත් සැකකරුවන් 8 දෙනකු එම සිරමැදිරියේ රඳවා සිට ඇති පසුබිමක සියලු සැකකරුවන් නින්දට ගියපසු අලුයම 3.30 ට පමණ ඔහු ඇඳ සිටි මේස් බැනියමේ කොටසක් ඉරාගෙන ඉන් සිරමැදිරියේ යකඩ බාර් එකේ එල්ලී ඇති බවත් අලුයම 3.55 ට ඔහුව රෝහල්ගත කරන විටත් ඔහු මියගොස් සිටි බවත් එම තරුණයා ගංජා භාවිතයට දැඩි ලෙස ඇබ්බැහිව සිටිමින් ගමට ගංජා රැගෙන යාමට සූදානම්ව සිටියදී අත්අඩංගුවට පත්ව ඇති බවට පොලිස් ආරංචි මාර්ග උපුටා දක්වමින් වාර්තා කර ඇත.

කෙසේ වුවද මියගිය තරුණයාගේ මව විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ලට අනුව සිය පුත්‍රයා පොලිස් භාරයේ පසුවන අතරතුර මෙලෙස සියදිවි හානිකර ගැනීම කිසිසේත්ම විශ්වාස කළ නොහැකි බවත් රාත්‍රී වැඩමුරයේ නිරතව සිටි පොලිස් නිලධාරීන් සහ සිරමැදිරියේ සිටි අනෙකුත් රැඳවියන් හත්දෙනෙකු සිටියදී මෙවැනි සිදුවීමක් කිසිවෙකුගේ හෝ නිරීක්ෂණයට ලක් නොවී සිදුවිය නොහැකි බවත් නිසි ආරක්ෂාවක් සැපයීමට පොලිසිය අපොහොසත් වී ඇති බවටත් චෝදනා කරන ඇය මේ පිළිබඳ සත්‍යතාව තහවුරු කරගැනීම සඳහා CCTV දර්ශන ඉල්ලීම් කළද බලධාරීන් ඒවා ලබාදීමට කටයුතු නොකළ බවත් සිය පුත්‍රයා සන්තකයේ තිබූ කළු බෑගය, ඇඳුම්, අත් ඔරලෝසුව, පාවහන් යුගල සහ ඉනපටිය පොලිසිය විසින් මෙතෙක් තමා වෙත ලබා නොදී රු. 1220.00 ක මුදලක් සහ ජංගම දුරකථනය පමණක් ලබාදුන් බවත් සඳහන් කර, මේ පිළිබඳ සොයා බලා සාධාරණය ඉටුකර දෙන ලෙස ඉල්ලා ඇත.

එමෙන්ම ලංකාදීප පුවත්පත මඟින් සිය පුත්‍රයා සහ පවුලේ කීර්තිනාමයට අපහාසාත්මක අයුරින් කරුණු වාර්තා කර ඇති බවත් ඔහු ගංජා භාවිතයට ඇබ්බැහිවූවෙකු බවට පළ කර ඇති වාර්තා සත්‍ය නොවන බවත් සිය දරුවා මීට පෙර කිසිදු අවස්ථාවක මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්ව නොමැති බව ද අවධාරණය කරන ඇය මෙම අසත්‍ය මාධ්‍ය වාර්තාකරණය සහ සිය පුත්‍රයාගේ මරණය සම්බන්ධයෙන් අපක්ෂපාතී විමර්ශනයක් පවත්වන ලෙස ඉල්ලීම් කර ඇත.

පැමිණිලිකාරිය වැඩිදුරටත් කරුණු දක්වමින්, හපුතලේ ලිපිනයේ පදිංචි සිය පුත්‍රයා පැලියගොඩ ප්‍රදේශයේ පදිංචි සිය ලොකු තාත්තාගේ නිවස වෙත පැමිණීම සඳහා 2018.01.10 දින පිටත්ව ආ බවත් එදින රාත්‍රී 10.00 ට පමණ ඔහු බස් රථයේ සිටියදී දුරකථනයෙන් තමා සමඟ කතා කළ බවත්, පසුදින දහවල් සිය මව විසින් දරුවා මියගොස් ඇති බව දැනුම්දීමෙන් පසු තමා රෝහලට ගොස් දේහය භාරගත් බවත් සඳහන් කර ඇත.

ඇය 2018.03.15 දින කරුණු දක්වමින්, පුවත්පත් වාර්තා මඟින් සිය පවුලට දැඩි අපහාසයක් සිදුවී ඇති බවත් නිලධාරීන් ලබාදුන් ප්‍රකාශයන්හි පැහැදිලි පරස්පරතාවන් පවතින බවත්, අධිකරණ වෛද්‍යවරයාගේ විමසීමේදී දරුවාගේ අතේ සිගරට්ටුවක් තිබීම නිසා අත්අඩංගුවට ගත් බව පොලිසිය ප්‍රකාශ කර ඇති බවත් මෘත ශරීරය භාර ගැනීමේදී මරණ කටයුතු සිදුකර ගැනීමට රු. 25,000.00 ක මුදලක් පොලිසිය පාර්ශ්වයෙන් ලබා දුන් බවත් ඇය සිය දරුවා මීට පෙර මත්ද්‍රව්‍ය භාවිතයෙන් අත්අඩංගුවට පත්ව නොමැති බවත් සිය දරුවා මියයාම සඳහා නිලධාරීන් විසින් නිසි ආරක්ෂාව සපයා නොමැති වීම සෘජුවම බලපා ඇති බවයි.

__මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේ වාර්තාව__

පිටකොටුව පොලිස් ස්ථානයේ සිර මැදිරිය තුළ පුද්ගලයෙකු මියයාම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් 2018.01.11 වන දින පෙරවරු 11.00 ට එම පොලිස් ස්ථානය වෙත ගොස් ස්ථානීය පරීක්ෂණයක් පවත්වා ඇත. එහිදී සිංහාරවත්ත, රන්වන් ගුහාව, තිරිවානාගම, හපුතලේ ලිපිනයේ පදිංචිව සිටි වයස අවුරුදු 18 ක් වූ ජයසේකර ආරච්චිගේ කුමුදු ලක්මාල් ජයසේකර යන අය මියගොස් සිටි බවත්, පිටකොටුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නලින් ජයසුන්දර මහතා විසින් ඒ පිළිබඳ තොරතුරු ලබා දී ඇත.

එම තොරතුරුවලට අනුව, මියගිය පුද්ගලයා 2018.01.11 වන දින අලුයම 00.40 ට පමණ ගංජා ළඟ තබා ගැනීමේ චෝදනාව මත අත්අඩංගුවට ගෙන, එදින අලුයම 02.30 ට පමණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන ලද ඔහුව අලුයම 02.55 ට සිර මැදිරිය තුළ රඳවා ඇත. මෙම අත්අඩංගුවට ගැනීමේ කටයුතු සඳහා පොලිස් පරීක්ෂක පැතුම් කුමාර, කාන්තා උප පොලිස් පරීක්ෂක ඒ. ඒ. සී. දමයන්ති, පොලිස් කොස්තාපල් 54478 වසන්ත සහ පොලිස් කොස්තාපල් 41051 රාජපක්ෂ යන නිලධාරීන් සහභාගී වී ඇත.

සිද්ධිය සිදුවන අවස්ථාව වන විට වේලාව අලුයම 03.30 පමණ වී තිබූ අතර, එම අවස්ථාවේදී සිර මැදිරි 08 කින් යුත් ඒකකය තුළ සැකකරුවන් 08 දෙනෙකු රඳවා සිට ඇත. අලුයම 03.30 ට පමණ උපසේවා රාජකාරියේ නිරතව සිටි නිලධාරියා සහ සිර මැදිරියේ සිටි සෙසු සැකකරුවන් විසින් ජයසේකර ආරච්චිගේ කුමුදු ලක්මාල් ජයසේකර යන අය අංක 03 දරන සිර මැදිරි දොරටුවට ඉහළින් ගෙල වැළලාගෙන එල්ලී සිටිනු දැක තිබුණි. ඒ සැණින් ක්‍රියාත්මක වූ උපසේවක පොලිස් නිලධාරියා සහ අනෙකුත් සැකකරුවන් විසින් ඔහුව බිමට ගෙන තිබූ අතර, ඉන් අනතුරුව වහාම රෝහල් ගත කර ඇත. එහෙත් රෝහලට ඇතුළත් කරන අවස්ථාව වන විටත් ඔහු මියගොස් සිටි බවත් සඳහන් කර ඇත. මෙම සිදුවීම සිදු වූ කාලසීමාව තුළ පොලිස් උපසේවය භාර නිලධාරියා ලෙස පොලිස් කොස්තාපල් 3948 රුක්මල්ගොඩ මහතා ද කාර්ය භාර නිලධාරී (SDO) වශයෙන් පොලිස් පරීක්ෂක ගංගානාථ මහතා ද රාජකාරියේ නිරතව සිට ඇත.

සිද්ධිය වන අවස්ථාවේ සිර මැදිරිය තුළ රැඳී සිටි සෙසු සැකකරුවන් ලෙස මාලිගාවත්ත පාරේ පදිංචි එම්.එච්.එම්. ෆජඩීන්, ආදුරුවීදියේ අමීර් අම්සාර් මොහොමඩ් අස්වර්, මාලිගාවත්තේ මොහොමඩ් අන්වර් සදාත්, නාගලගම්වීදියේ එම්. ඉම්තියාස්, මරදානේ මොහොමඩ් ෆායිස්, යාපනයේ එම්. සුජීවන් සහ බකමූණ ප්‍රදේශයේ එම්. ජී. ජයරුවන් යන අය හඳුනාගෙන ඇත. ස්ථානීය පරීක්ෂාව සිදු කරන අවස්ථාව වන විට මියගිය පුද්ගලයාගේ දේහය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර තිබූ අතර, 2018.01.11 වන දින උදෑසන කොළඹ මහේස්ත්‍රාත්වරයා විසින් එම ස්ථානය පරීක්ෂා කර ඇත. එමෙන්ම කොළඹ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ මහතා ද ස්ථානීය පරීක්ෂාවක් සිදු කළ බවත්, කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා ද ඉදිරි විමර්ශන සඳහා ස්ථානීය පරීක්ෂාවකට සහභාගී වීමට නියමිතව සිටි බවත් ස්ථානාධිපතිවරයා විසින් වැඩිදුරටත් දැනුම් දී ඇත.

<u>වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම -</u>

1. නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය විසින් 2018.01.25 දිනැතිව මෙම සිදුවීම සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාවට අනුව, පිටකොටුව පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක පැතුම් කුමාර ඇතුළු කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත සිදු කළ වැටලීම්වලදී, මියගිය සැකකරු වන ජයසේකර ආරච්චිගේ සුමුදු ලක්මාල් ජයසේකර ඇතුළු සැකකරුවන් සිව්දෙනෙකු සහ එක් සැකකාරියක අත්අඩංගුවට ගෙන ඇත. මොවුන් 2018.01.11 වන දින අලුයම 02.30 ට පොලිස් ස්ථානයේ උපසේවා රාජකාරියේ නිරතව සිටි පො.කො. 34948 රුක්මල්ගොඩ නිලධාරියා වෙත භාර දෙනු ලැබූ අතර, ඉන් අනතුරුව සැකකාරිය අංක 01 දරන සිර මැදිරියටත්, සෙසු සැකකරුවන් සිර මැදිරි හයකින් යුත් අනෙක් සිර මැදිරි ඒකකයටත් අලුයම 02.55 ට ඇතුළත් කිරීමට පියවර ගෙන තිබුණි. උපසේවා නිලධාරී රුක්මල්ගොඩ මහතා අලුයම 04.00 ට පමණ රාජකාරි කරමින් සිටියදී 07 වන සිර මැදිරියේ සිටි සැකකරුවෙකුගේ කෑගැසීමක් පිළිබඳව අවධානය යොමු කළ අවස්ථාවේදී, 03 වන සිර මැදිරි දොරටුවේ යකඩ පට්ටමක සුදු පැහැති රෙදි පටියක් ආධාරයෙන් සුමුදු ලක්මාල් ජයසේකර යන සැකකරු ගෙල වැළලාගෙන සිටිනු නිරීක්ෂණය වී ඇත. වහාම ක්‍රියාත්මක වූ නිලධාරීන් සහ අනෙකුත් රැඳවියන්ගේ සහයෝගය ඇතිව සැකකරුව පහතට ගෙන කොළඹ ජාතික රෝහලේ හදිසි ඇමතුම් ඒකකය වෙත ඇතුළත් කර තිබූ නමුත්, ඒ වන විටත් ඔහු මියගොස් සිටි බව පරීක්ෂා කළ වෛද්‍යවරයා විසින් තහවුරු කර ඇත.

මෙම සිදුවීමට පසුබිම් වූ කරුණු ලෙස වාර්තාවේ, පිටකොටුව ස්ථානාධිපතිවරයාගේ නියෝග මත පොලිස් පරීක්ෂක නිශාන් පැතුම් කුමාර ඇතුළු කණ්ඩායමක් විසින් බැස්ටියන් මාවත පොදු වැසිකිළිය තුළ සිදුකළ වැටලීමකදී සැකකරු ගංජා ග්‍රෑම් 50ක් සමඟ අත්අඩංගුවට ගත් බවත්, මරණයට අදාළ පශ්චාත් මරණ පරීක්ෂණය අලුත්කඩේ අංක 03 මහේස්ත්‍රාත් අධිකරණයේදී ගරු මහේස්ත්‍රාත් දර්ශිකා විමලසිරි මහත්මියගේ නියෝග පරිදි ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී අජිත් තෙන්නකෝන් මහතා සහ සහකාර අධිකරණ වෛද්‍ය නිලධාරී එස්. හේවගේ මහතා විසින් සිදුකර තිබුණි. එහිදී මරණයට හේතුව ගෙල වැළලා ගැනීම බවත් ශරීරය මත වධහිංසා පැමිණවීමකට අදාළ කිසිදු තුවාලයක් නොමැති බවත් තීරණය වී ඇත. 2018.01.12 වන දින පැවති මහේස්ත්‍රාත් පරීක්ෂණයේදී මරණකරු සමඟ සිර මැදිරියේ රැඳී සිටි මොහොමඩ් සප්‍රදීන්, මොහොමඩ් ෆායිස් උස්මාන්, හසිත් ජයරුවන්, අමීර් අන්සාර් මොහොමඩ් අස්වාර් සහ මහේන්ද්‍රන් සුජීවන් යන සැකකරුවන්ගේ සාක්ෂි විවෘත අධිකරණයේදී මෙහෙයවා තිබූ අතර මහේස්ත්‍රාත්වරයාගේ අවසන් තීරණය ඒ වන විට ප්‍රකාශයට පත් කර නොතිබුණි.

මරණය සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනවලට යටත්ව, පිටකොටුව ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නලින් ජයසුන්දර මහතාව මඩකලපුව කොට්ඨාසයට වහාම ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරු කර ඇති අතර, සිද්ධිය වූ අවස්ථාවේ රාත්‍රී රාජකාරි භාරව සිටි පොලිස් පරීක්ෂක හපුතන්ත්‍රිගේ ක්‍රිෂාන්ත ගංගානාථ සහ උපසේවා නිලධාරී පො.කො. 34948 ජගත් රුක්මල්ගොඩ යන නිලධාරීන්ගේ වැඩ තහනම් කිරීමට පියවර ගෙන ඇත. පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවලට අනුව මරණයට හේතුව ස්වයංව සිදුකරගත් ගෙල වැළලා ගැනීමක් බවත්, සැකකරු අත්අඩංගුවට ගත් ස්ථානයේ සිටි භාරකරුගේ සහ අනෙකුත් රැඳවියන්ගේ ප්‍රකාශ අනුව ඔහු කිසිදු පහරදීමකට ලක්ව නොමැති බවත් අනාවරණය වී ඇත. එසේම මියගිය තරුණයාගේ මව, සීයා සහ බාප්පා යන ඥාතීන්ගේ ප්‍රකාශ අනුව ඔහු මත්ද්‍රව්‍ය භාවිතයට තදින් ඇබ්බැහි වූවෙකු බව හෙළි වී ඇති බවත්, සාක්ෂි සහ වෛද්‍ය වාර්තා අනුව මෙය සියදිවි හානිකර ගැනීමක් බව නිගමනය කළ හැකි වුවද, අවසන් තීරණය මහේස්ත්‍රාත් මරණ පරීක්ෂණ තීන්දුව අනුව සිදුකළ යුතු බවත්, නිලධාරීන් විසින් සිය රාජකාරිය පැහැර හැරීමක් සිදුකර ඇත්ද යන්න පිළිබඳ කෙරෙන මූලික විමර්ශනවලින් අනතුරුව ඔවුන්ට එරෙහිව වැඩිදුර විනයානුකූල පියවර ගැනීමට නියමිත බවත් එම වාර්තාවේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

**2. පළමු වගඋත්තරකරු - නලින්ද ජයසුන්දර (ස්ථානාධිපති- පිටකොටුව පොලිස් ස්ථානය)**

2024.11.04 වන දින සිදුවීම වන අවස්ථාවේ දී පිටකොටුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස කටයුතු කළ නලින්ද ජයසුන්දර ප්‍රකාශයක් ලබා දෙමින්, ඔහු 2017.07.02 වන දින පොලිස්පතිවරයාගේ ස්ථාන මාරුවීම් නියෝගයකට අනුව පිටකොටුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වශයෙන් රාජකාරි වාර්තා කර තිබූ බවත්, පිටකොටුව පොලිස් ස්ථානය 'A' ශ්‍රේණියේ පොලිස් ස්ථානයක් වන අතර එහි පොලිස් වසම වර්ග කිලෝමීටර් 1.5 කට වැඩි භූමි ප්‍රමාණයක ව්‍යාප්තව පවතින බවත්, එය කොටුව, කෙසෙල්වත්ත, මරදාන, කොටහෙන, වෙල්ලවීදිය සහ ආදුරුප්පු වීදිය යන පොලිස් වසම්වලින් මායිම් වී ඇති බවත් සඳහන් කර ඇත. එම වකවානුව වන විට අදාළ වසමේ ස්ථිර ජනගහනය 29,044 ක් පමණ වුවද, අතිශය ජනාකීර්ණ වෙළඳ කලාපයක් බැවින් දෛනිකව ලක්ෂ ගණනකට අධික ජනතාවක් දෛනිකව ගැවසෙන බවත්, විවිධ අපරාධකරුවන් මෙන්ම මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරන්නන් ද සැරිසරන බැවින් පොලිස් ස්ථානයට අනුයුක්ත නිලධාරීන් 95 ක් පමණ නිරන්තරයෙන් රාජකාරියේ යොදවන බවයි.

2018.01.06 දින මූලස්ථාන පොලිස් පරීක්ෂක (කන්කසන්තුරේ) මහින් මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 12579/17 දරන නඩුවේ සැකකරු මුත්තයියා ගුණසීලන්ට එරෙහිව මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන B436/2014 නඩුව සඳහා පෙනී සිටින ලෙසට ඔහු වෙත සහ උප පොලිස් පරීක්ෂක අනුරංජිත් හට නොතීසි නිකුත් කර ඇත. ඒ අනුව, ලිඛිත අවසරය ලබාගෙන 2018.01.09 වන දින පොලිස් පරීක්ෂක සිලෝගම, උප පොලිස් පරීක්ෂක අනුරංජිත් සහ පොලිස් කොස්තාපල් 4822 ජනක යන නිලධාරීන් සමඟ ඔහු මල්ලාකම් අධිකරණය බලා පිටත්ව ගොස් ඇත. ඔහු නැවත පැමිණෙන තෙක් පොලිස් ස්ථානයේ වැඩ බලන ස්ථානාධිපති ලෙස පොලිස් පරීක්ෂක නෙවිල් ප්‍රියන්තව පත් කර ඇති අතර, ඒ පිළිබඳව තොරතුරු පොතේ පිටු අංක 178, ඡේද අංක 1034 ප්‍රකාරව එදින පෙරවරු 11.30 ට සටහන් යොදා තිබූ බවත් සඳහන් කර ඇත.

මල්ලාකම් අධිකරණයේ රාජකාරි නිමවා 2018.01.11 වන දින අලුයම 05.00ට ඔහු නැවත සිය රාජකාරි ස්ථානයට පැමිණි අවස්ථාවේදී, වැඩ බලන ස්ථානාධිපති පොලිස් පරීක්ෂක නෙවිල් ප්‍රියන්ත සහ එදින කාර්යභාර නිලධාරී (SDO) ලෙස රාජකාරි කළ පොලිස් පරීක්ෂක ගංගානාථ විසින් ඔහුට දන්වා ඇත්තේ වැටලීමකින් අත්අඩංගුවට ගෙන සිටි සැකකරුවෙකු සිරමැදිරිය තුළ ගෙල වැළලාගෙන සිටියදී රෝහල්ගත කළ බවත්, රෝහලේදී ඔහු මියගොස් ඇති බවත්ය. ඒ අනුව ඔහු සිරමැදිරි පරීක්ෂා කළ අවස්ථාවේදී අංක 01 මැදිරියේ කාන්තාවක් ද, අංක 02 සහ 03 සිරමැදිරිවල සැකකරුවන් නොමැති බව ද, කෙළවර මැදිරිය තුළ සැකකරුවන් කිහිපදෙනෙකු සිටින බව ද නිරීක්ෂණය කර තිබුණි. රඳවාගැනීමේ ලේඛනයට අනුව කාන්තාවක් සහ පිරිමි සැකකරුවන් හත්දෙනෙකු සිටි බවත්, මේ පිළිබඳව ඉහළ නිලධාරීන් දැනුවත් කර ඇති බවට තහවුරු කරගෙන ඔහු ද නැවත අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගෙන ඇති බවයි.

අනතුරුව අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයට B28308/03/2018 යටතේ කරුණු වාර්තා කර, ගරු මහේස්ත්‍රාත්වරිය පැමිණ ස්ථානීය පරීක්ෂණයක් පවත්වා නිරීක්ෂණ සටහන් කර ඇත. ඔහු ද රෝහල වෙත ගොස් මෘත ශරීරාගාරයේ අංක 2867 දරන හිසපත් අංකය යටතේ දේහය පරීක්ෂා කර නිරීක්ෂණ සටහන් කළ බවත්, මියගිය කුමුදු ලක්මාල් ජයසේකරගේ දේහය අධිකරණ නියෝග මත පශ්චාත් මරණ පරීක්ෂණයට ලක් කළ අතර එහිදී මෘත ශරීරයේ බාහිර හෝ අභ්‍යන්තර තුවාල කිසිවක් නොමැති බවත් මරණයට හේතුව ගෙල වැළලා ගැනීම බවත් වෛද්‍ය නිලධාරියා තීන්දු කර තිබූ බවත් සඳහන් කර ඇත.

එසේම, ඔහු ස්ථානාධිපති ලෙස රාජකාරි භාරගත් දින සිට සෑම උපදෙස් පන්තියකදීම සැකකරුවන්ගේ ආරක්ෂාව, අත්අඩංගුවට ගන්නා නිලධාරියාගේ වගකීම මෙන්ම උපසේවක සහ කාර්යභාර නිලධාරියාගේ කාර්යභාරය පිළිබඳව පැහැදිලි උපදෙස් ලබා දී තිබූ බවයි. උපසේවා නිලධාරීන් සඳහා ස්ථාවර නියෝග 03/2018 නිකුත් කර තිබූ අතර, සිරමැදිරි පෙනෙන පරිදි නිලධාරීන් ස්ථානගත කර තිබූ බවත් සීසීටීවී (CCTV) කැමරා පද්ධතියක් ද සවි කර තිබූ බවත් ඔහු සඳහන් කර ඇත. මෙම සිදුවීම වන අවස්ථාවේ ඔහු ස්ථානයේ නොසිටි බවත්, මේ පිළිබඳව කෙරුණු විමර්ශනවලින් පසු රාජකාරි භාර නිලධාරී පොලිස් පරීක්ෂක ගංගානාථ සහ උපසේවා නිලධාරී පොලිස් කොස්තාපල් 34948 ජගත් රුක්මල්ගොඩගේ වැඩ තහනම් කළ බවත් සඳහන් කර ඇත. වැඩ බලන ස්ථානාධිපති පොලිස් පරීක්ෂක නෙවිල් ප්‍රියන්තව ස්ථාන

මාරු කළ බවත්, පසුව දැනගන්නට ලැබුණු පරිදි ඔවුන්ව නිදොස් කොට නිදහස් කර ඇති බවත් ඔහු සඳහන් කර ඇත. ඔහු එදින රාජකාරියේ නොසිටිය ද, තමා ද තනතුරෙන් ඉවත් කර මඩකලපුව ප්‍රදේශයට සාමාන්‍ය රාජකාරි සඳහා මාරු කළ බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

තව ද, පැමිණිලිකාරිය විසින් CCTV දර්ශන කිසිදු අවස්ථාවක ඉල්ලා නොතිබූ බවත්, ඉල්ලීමක් කළේ නම් ඒවා ලබාදීමට හැකියාව තිබූ බවත්, මරණ කටයුතු සඳහා රු. 25,000 ක මුදලක් ලබාදීම සම්බන්ධයෙන් පැමිණිල්ල මගින් ඉදිරිපත් කර තිබූ කරුණු පිළිබඳව විමසීමේදී, දේහය බදුල්ල ප්‍රදේශයට රැගෙන යාමට පවුලට වත්කමක් නොතිබූ බැවින් මානුෂීය පදනම මත එම මුදල ලබා දුන් බව ඔහු දන්නා බවත්, එය සිද්ධිය වසන් කිරීමේ හෝ වෙනස් කිරීමේ චේතනාවෙන් කළ දෙයක් නොවන බවත් සඳහන් කර ඇත. එසේම, ලංකාදීප පුවත්පතට ලබා දී ඇති තොරතුරු පොලිස් නිලධාරියෙකු හෝ පොලිස් මාධ්‍ය කොට්ඨාසය විසින් ලබා නොදුන් බව ද අවධාරණය කර ඇත.

### 3. දෙවන වගඋත්තරකරු පොලිස් පරීක්ෂක එච්. ක්‍රිෂාන්ත ගංගානාථ - කාර්යභාර නිලධාරී

පොලිස් මානව හිමිකම් කොට්ඨාසය විසින් යොමු කරන ලද 2025.03.31 දිනැති ලිපිය මගින් මෙම නිලධාරියා මාන්කුලම් පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කරමින් සිටියදී 2020.02.17 වන දින සේවයෙන් පහ කර ඇති බව දැනුම් දී ඇත. මෙම විමර්ශන කටයුතු සඳහා පෙනී සිටින ලෙස ඔහුගේ පෞද්ගලික ලිපිනය වෙත 2025.06.04 වන දින කැඳවීම් සිදු කර ඇති නමුත්, ඒ සඳහා ඔහු සහභාගී වී නොමැත.

### 4. තෙවන වගඋත්තරකරු විජේතුංග පටබැඳිගේ ජගත් රුක්මල්ගොඩ - උප සේවක නිලධාරී

2025.06.04 වන දින, ප්‍රකාශයන් ලබාදෙමින්, ඔහු 2018.01.10 වන දින පැය 22.00 සිට පැය 06.00 දක්වා වූ කාලසීමාව තුළ රාත්‍රී උපසේවා රාජකාරියේ නිරත වන ලෙස ස්ථානාධිපතිවරයා ලබා දුන් නියෝගය පරිදි නිසි සටහන් යොදා තමා රාජකාරි භාරගත් බවත්, එම අවස්ථාවේදී කාර්යභාර නිලධාරියා (SDO) වශයෙන් පොලිස් පරීක්ෂක ගංගානාථ මහතා රාජකාරියේ නිරතව සිටි බවත් සඳහන් කර ඇත. රාජකාරි භාරගන්නා අවස්ථාව වන විට පදික වෙළඳාම සහ හෙරොයින් ළඟ තබා ගැනීම යන චෝදනා මත සැකකරුවන් දෙදෙනෙකු සිරමැදිරි තුළ රඳවා සිටි බවත්, ඒ පිළිබඳව පැය 23.15 ට ඔහු විසින් සටහන් තබා තිබූ බවයි. 2018.01.11 වන දින අලුයම 01.10ට අපරාධ අංශයේ පොලිස් කොස්තාපල් (35369) රූපසිංහ යන නිලධාරියා විසින් සොරකමකට සැකපිට පුද්ගලයන් දෙදෙනෙකු ඔහු වෙත භාර දී ඇති අතර, ඒ පිළිබඳව කාර්යභාර නිලධාරී පොලිස් පරීක්ෂක ගංගානාථ මහතා දැනුවත් කර පැය 02.12 ට දෛනික තොරතුරු සටහන් පොතේ සටහන් තබා ඇති බව ඔහු ප්‍රකාශ කර ඇත.

අනතුරුව පැය 02.55ට දූෂණ මර්දන අංශයේ පොලිස් පරීක්ෂක පැතුම් කුමාර මහතා විසින් සැකකරුවන් සිව්දෙනෙකු සහ එක් සැකකාරියක ඉදිරිපත් කළ බවත්, ඔවුන් පරීක්ෂා කර සිරමැදිරියේ රඳවා තැබීමට ඔහු කටයුතු කළ බවත් සඳහන් කර ඇත. එහිදී සැකකාරිය කාන්තා පොලිස් කොස්තාපල් (8787) පුෂ්පාංජලී නිලධාරිනිය විසින් පරීක්ෂා කිරීමෙන් පසු ඇයගේ ආරක්ෂාව යටතේ අංක 01 දරන සිරමැදිරියේ රඳවා තිබූ බවත්, අනෙකුත් සැකකරුවන් පරීක්ෂා කිරීමේදී ඔවුන් සතුව තමාට හානි කරගත හැකි කිසිදු දේපළක් නොවූ බවත්, ඔවුන් සන්තකයේ තිබුණේ ඇඳ සිටි ඇඳුම් පමණක් බවත්, ඔහු කිහිප අවස්ථාවකදීම සිරමැදිරිය ආසන්නයට ගොස් සැකකරුවන් පරීක්ෂා කළ බවත් සඳහන් කර ඇත.

පැය 04.00 ට ආසන්න වේලාවකදී ඔහු උපසේවා පුටුවේ වාඩි වී සිටින අවස්ථාවේදී සිරමැදිරිය තුළ සිටි රැඳවියෙකු "සර්, සර්" යනුවෙන් කෑගසනු ඇසී වහාම සිරමැදිරිය වෙත ගොස් පරීක්ෂා කිරීමේදී, අංක 03 දරන සිරමැදිරි දොරටුවට ඉහළින් වූ යකඩ රාමුවේ පුද්ගලයෙකු එල්ලී සිටිනු නිරීක්ෂණය කළ බවත්, ඒ සැණින් ඔහු කාර්යභාර නිලධාරී පොලිස් පරීක්ෂක ගංගානාථ මහතාට දැනුම් දී, සිරමැදිරිය විවෘත කර ගෙල වැළලාගෙන සිටි පුද්ගලයා දෙපාවලින් ඔසවා ගත් බවත්, සිරමැදිරියේ සිටි තවත් සැකකරුවෙකුගේ සහය ඇතිව ගෙලෙහි වූ රෙදි පටිය ඉවත් කිරීමට කටයුතු කළ බවත් සඳහන් කර ඇත. පසුව පොලිස්

පරීක්ෂක ගංගානාථ මහතා ගිලන් ඇඳක් සූදානම් කර එල්ලී සිටි පුද්ගලයා එහි දිගාකර වූ කළ බවත්, රාත්‍රී ජංගම සංචාරයේ යෙදී සිටි උප පොලිස් පරීක්ෂක චාමර යන නිලධාරියා ගෙන්වා වහාම සැකකරුව වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝහල්ගත කිරීමට පියවර ගත් බවත් සඳහන් කර ඇත.

රඳවා තැබීම සඳහා භාර දුන් පුද්ගලයා වයස අවුරුදු 17 ක තරුණයෙකු බව තමා දැන සිටි බවත්, පොලිස් දෙපාර්තමේන්තු නියෝග (A 20 5 D සහ E) ප්‍රකාරව ළමා හෝ තරුණ වැරදිකරුවන් වැඩිහිටියන් සමඟ එකම සිරමැදිරියක රඳවා නොතැබිය යුතු බවට වූ නියෝග සහ බීමත්ව සිටින පුද්ගලයන් පරීක්ෂා කළ යුතු කාලසීමාවන් පිළිබඳව තමා දැනුවත් බවත් සඳහන් කර ඇත. අදාළ සැකකරු තමා වෙත භාර දී පැයකට ආසන්න කාලයක් තුළ මෙම සියදිවි හානිකර ගැනීම සිදු කරගෙන ඇති බවත්, සැකකරුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීමට තමාට නෛතික බලතල නොමැති බැවින් එවැනි ප්‍රකාශයක් සටහන් කර නොමැති බවත් සඳහන් කර ඇත. පොලිස් දෙපාර්තමේන්තු නියෝග 6 (B) ප්‍රකාරව උපසේවා නිලධාරියා විසින් භාරයට ගන්නා දේපළ සම්බන්ධයෙන් තොරතුරු පොතේ සහ බඩු කුවිතාන්සි පොතේ සටහන් තැබීම පිළිබඳව ඔහු දැනුවත්ව සිටියද, පැමිණිලිකාරිය පවසන පරිදි ඇගේ පුත්‍රයා සතුව තිබූ බෑගය, ඇඳුම්, අත් ඔරලෝසුව, පාවහන් සහ ඉනපටිය (Belt) පොලිසිය විසින් ලබා දී නොමැති බවට කරන චෝදනාව සම්බන්ධයෙන් ඔහු පවසා සිටින්නේ, සැකකරු තමා වෙත භාර දෙන අවස්ථාවේදී ඔහු සතු දේපළ ලෙස ලැබුණේ මුදල් පමණක් බවයි.

මෙම සිදුවීම සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තු මට්ටමින් කෙරුණු විමර්ශනයකින් පසු තමා වෙත 'අවවාද පත්‍රයක්' නිකුත් කර ඇති බවත්, පිටකොටුව පොලිස් ස්ථානයේ උපසේවා නිලධාරියා සිටින ස්ථානය සහ සිරමැදිරි පිහිටා ඇති ආකාරය අනුව නිලධාරියාට සිරමැදිරි තුළ සිටින සැකකරුවන් නිසි පරිදි දර්ශනය නොවන බවත්  ඔහු සඳහන් කර ඇත. එසේම සැකකරුවන්ගේ ආරක්ෂාව සඳහා සහායක උපසේවා නිලධාරියෙකු යොදවා නොතිබූ බවත්, මියගිය පුද්ගලයාගේ දෙමාපියන් වෙත පොලිසිය විසින් රුපියල් 25,000/- ක මුදලක් ලබා දුන් බව දැන සිටියද, එම මුදල් ලබා දුන් පුද්ගලයා හෝ එහි අරමුණ පිළිබඳව ඔහු දැනුවත් නොමැති බවත්, සාමාන්‍යයෙන් පොලිස් ස්ථානයක මෙවැනි මුදල් ප්‍රදානයන් සිදු නොවන බවත් සඳහන් කර ඇත. වෛද්‍ය පරීක්ෂණ වාර්තාව නිකුත් වීමට පෙර ලංකාදීප පුවත්පතේ පළ වූ තොරතුරු සැපයීම සම්බන්ධයෙන් තමා කිසිවක් නොදන්නා බව සඳහන් කර ඇති ඔහු, තමා 2025.05.01 වන දින සේවයෙන් විශ්‍රාම ලැබූ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

5. **සිව්වන වගඋත්තරකරු නෙවිල් ප්‍රියන්ත මුදලිගේ - ස්ථානාධිපති රාජකාරී ආවරණ නිලධාරී**

2025.09.26 දින අය ප්‍රකාශයක් ලබා දෙමින් , ඔහු 2018.01.10 වන දින පිටකොටුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා අධිකරණ රාජකාරි සඳහා සහභාගී වීම හේතුවෙන් ඔහු එදින වැඩ බලන ස්ථානාධිපති ලෙස රාජකාරි ආවරණය කර ඇති බවත්, එදින රාත්‍රී 21.15 ට විවේකය වාර්තා කර සිය නවාතැන්පළ වෙත ගිය බවත් සඳහන් කර ඇත. එම රාත්‍රියේ පොලිස් පරීක්ෂක පැතුම් ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් වැටලීම් රාජකාරි සඳහා පිටත්ව ගොස් පුද්ගලයන් කිහිප දෙනෙකු සහ කාන්තාවක අත්අඩංගුවට ගෙන තිබූ බවත්, අත්අඩංගුවට ගත් පිරිස අතර සිටි ගංජා සන්තකයේ තබා ගැනීමේ චෝදනා ලැබූ තරුණයෙකු සිරමැදිරිය තුළ ඔහු ඇඳ සිටි බැනියම ආධාරයෙන් ගෙල වැළලාගෙන සිටීම හේතුවෙන් රෝහල්ගත කළ බව පසුදින උදෑසන 05.00 ට පමණ උපසේවා රාජකාරියේ නිරතව සිටි නිලධාරියා විසින් ඔහු වෙත දැනුම් දී ඇති බවත් සඳහන් කර ඇත.

ඔහු පොලිස් ස්ථානය වෙත පැමිණෙන විට සියදිවි හානිකර ගැනීමට තැත් කළ අදාළ පුද්ගලයා රෝහල වෙත රැගෙන ගොස් තිබූ බවත්, ඒ සමඟම ස්ථානාධිපතිවරයා සහ පිටකොටුව භාර සහකාර පොලිස් අධිකාරීවරයා ද මේ පිළිබඳව දැනුවත් කර තිබූ බවත් සඳහන් කර ඇත. ගෙල වැළලාගත් තරුණයා මියගොස් ඇති බව පසුව දැනගන්නට ලැබුණු බවත්, සිද්ධිය සම්බන්ධයෙන් නිලධාරීන්ගේ රාජකාරි පැහැර හැරීමක් හෝ අතපසු වීමක් සිදුවී ඇත්දැයි සොයා බැලීම සඳහා පොලිස් මූලස්ථානය මඟින් වෙනම

විමර්ශනයක් පවත්වන ලද බවත්, මියගිය තැනැත්තා සම්බන්ධයෙන් මරණ පරීක්ෂණ කටයුතු සිදු කරන ලද බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

**6. පස්වන වගඋත්තරකරු පොලිස් පරීක්ෂක එච්.පී.එන්.පැතුම් කුමාර- වැටලීම් නිලධාරී**

2025.07.04 වන දින ප්‍රකාශයක් ලබා දෙමින්, ඔහු දෛනිකව දූෂණ මර්දන වැටලීම් රාජකාරිවල නිරත වන බවත්, සිද්ධිය වූ දින ද සාමාන්‍ය රාජකාරි පටිපාටිය යටතේ සැකකරුවන් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ බවත් ඔහු සඳහන් කර ඇත. එහිදී පිටකොටුව බැස්ටියන් මාවත බස් නැවතුම්පළෙහි පිහිටි පොදු වැසිකිළිය අසලදී ගංජා මත්ද්‍රව්‍ය ග්‍රෑම් 50 කට ආසන්න ප්‍රමාණයක් සන්තකයේ තබා ගැනීමේ චෝදනාව මත වින්දිත සැකකරුව අත්අඩංගුවට ගත් බව සඳහන් කර ඇත. අත්අඩංගුවට ගැනීමෙන් පසුව, මුල් අවස්ථාවේදී නිල සටහන් ඇතුළත් කිරීමකින් තොරව සැකකරුව බැස්ටියන් මාවත පොලිස් මුරපොළෙහි ආරක්ෂිතව රඳවා තබා ගත් බවත්, අනතුරුව සෙසු සැකකරුවන් ද සමඟ ඔහු පිටකොටුව පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවයි.

පොලිස් ස්ථානයට පැමිණීමෙන් පසු, සැකකරුවන් සහ අත්අඩංගුවට ගත් නඩු භාණ්ඩ නිසි පරිදි සටහන් යොදා ස්ථානයේ උපසේවා නිලධාරියා වෙත භාර දීමට කටයුතු කළ බවත්, ඉන් අනතුරුව ඔහු සිය විවේකය සඳහා හට නිවාසය වෙත වාර්තා කළ බවත්, සිද්ධිය වූ දින අලුයම 3.00 ත් 3.30 ත් අතර කාලයේදී පොලිස් කොස්තාපල් වසන්ත නැමැති නිලධාරියා පැමිණ, ගංජා චෝදනාව මත රඳවා සිටි සැකකරු සියදිවි නසාගෙන ඇති බවට තොරතුරු දැන්වූ බව සඳහන් කර ඇත. එම පුවත සැලවූ සැණින් ඔහු පොලිස් ස්ථානයේ පහළ මාලය වෙත ගිය බවත්, ඒ වන විට ස්ථානයේ සිටි නිලධාරීන් විසින් සැකකරුව රෝහල්ගත කිරීමට පියවර ගනිමින් සිටිනු දුටු බව සඳහන් කර ඇත. රෝහල්ගත කරන අවස්ථාව වන විට සැකකරු මියගොස් ඇති බව තමා දැන නොසිටි බවත්, ඒ පිළිබඳව පසුව දැනගත් බවත් සඳහන් කර ඇත.

පසුව කොට්ඨාස භාර නිලධාරියා විසින් මේ පිළිබඳව විමසීම් කළ අවස්ථාවේදී, සැකකරුට පහරදීමක් සිදු කර ඇත්දැයි විමසූ බවත්, තමා එවැනි පහරදීමක් සිදු නොකළ බව එහිදී ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව මඟින් ද පහරදීමක් සිදු වී නොමැති බව තහවුරු වී ඇති බව තමා දැනගත් බවත්, මෙම සිද්ධියෙන් පසුව ඥාතීන් සුළු පිරිසක් විරෝධතාවයක නිරත වූ බවත් , අනතුරුව සිදු වූ අභ්‍යන්තර විමර්ශනයේදී සැකකරු භාරගත් උපසේවා නිලධාරියාගේ වැඩ තහනම් කළ බවත්, සිද්ධිය වන විට ස්ථාන භාර නිලධාරී ලෙස කටයුතු කළ පොලිස් පරීක්ෂක නෙවිල් ප්‍රියන්ත මහතා වෙත ආයතන සංග්‍රහය යටතේ චෝදනා පත්‍රයක් නිකුත් කළ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

කොමිෂන් සභාව විසින්, දූෂණ මර්දන තොරතුරු පොතේ වැටලීම් සටහන් පිළිබඳව ප්‍රශ්න කිරීමේදී, වැසිකිළිය තුළ සිට ගංජා පානයට සමාන දුර්ගන්ධයක් හැමීම හේතුවෙන් සැකකරු පිටතට එන තෙක් රැඳී සිට ඔහුව අත්අඩංගුවට ගත් බවට වූ සටහන නිවැරදි බව පිළිගෙන ඇත. තමා එම දුර්ගන්ධය පදනම් කරගෙන සැකකරු ගංජා පානය කරන්නේ යැයි උපකල්පනය කළ බවත්, පසුව ඔහු සන්තකයේ මත්ද්‍රව්‍ය තිබූ බැවින් අත්අඩංගුවට ගත් බවත් ඔහු සඳහන් කර ඇත.

එසේම, සැකකරුගේ වයස අවුරුදු 15 ක් බව තමා නොදැන සිටි බවත්, වාචිකව විමසීමේදී සැකකරු සිය වයස අවුරුදු 17 ක් බව පැවසූ බවත්, විශේෂයෙන්ම උපසේවා නිලධාරියා වෙත වයස පිළිබඳව දැනුවත් කිරීමක් සිදු නොකළ බවත්, අධිකරණ වෛද්‍ය වාර්තාව මඟින් වින්දිතයා මරණයට පෙර කිසිදු මත්ද්‍රව්‍යයක් භාවිත කර නොමැති බව තහවුරු වී තිබියදී, ගංජා දුර්ගන්ධය පදනම් කරගෙන අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් විමසූ විට, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ ගංජා දුර්ගන්ධයට සමාන ගන්ධයක් දැනුණු බව සත්‍යයක් බවත්, එහෙත් ඔහු මත්ද්‍රව්‍ය පානය කළා ද නැද්ද යන්න පිළිබඳව තමාට නිශ්චිතව

කිව නොහැකි බවත් සඳහන් කර ඇත. තමා සැකකරු අත්අඩංගුවට ගනු ලැබුවේ මත්ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීමේ වරදට බවත් ඔහු සඳහන් කර ඇත.

සීසීටීවී (CCTV) දර්ශන පිළිබඳව විමසීමේදී, උපසේවා නිලධාරියා සිටින ස්ථානය ආවරණය වන පරිදි කැමරාවක් තිබූ බවත්, එහෙත් සිරමැදිරි ආවරණය වන පරිදි කැමරාවක් තිබූ බවට මතකයක් නොමැති බවත් ඔහු සඳහන් කර ඇත. වින්දිතයාගේ දෙමාපියන් වෙත පොලිස් ස්ථානය මගින් රුපියල් 25,000 ක මුදලක් ලබාදීම සම්බන්ධයෙන් තමා දැනුවත් නොමැති බවත්, තමා එවැනි මුදල් ලබාදීමක් සිදු නොකළ බවත් ඔහු සිය ප්‍රකාශය මගින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

## 7. හයවන, හත්වන සහ අට වන වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම

(කා.උ.පො.ප. චන්ද්‍රා දමයන්ති, පො.කො. 54478 වසන්ත සහ පො.කො. 61051 රාජපක්ෂ අය විසින් දිවුරුම් ප්‍රකාශ මගින් කරුණු ඉදිරිත් කරමින්, 2018.01.10 වන දින පිටකොටුව පොලිස් ස්ථානයේ දූෂණ මර්දන වැටලීම්වලට එක්ව මියගිය සුමුදු ලක්මාල් ජයසේකර ඇතුළු සැකකරුවන් පිරිසක් අත්අඩංගුවට ගත් බව සඳහන් කර ඇත. බැස්ටියන් මාවත පොදු වැසිකිළිය අසළදී ගංජා ග්‍රෑම් 50ක් සමඟ සුමුදු ලක්මාල් අත්අඩංගුවට ගත් බවත්, අලුයම 02.30 ට පමණ සියලු සැකකරුවන් සහ නඩු භාණ්ඩ නීත්‍යානුකූලව උපසේවා නිලධාරියා වෙත භාරදුන් බවත් ඔවුන් සඳහන් කර ඇත.

සැකකරුවන් භාරදෙන අවස්ථාවේදී ඔවුන් සාමාන්‍ය තත්ත්වයෙන් පසුවූ බවත්, සුමුදු ලක්මාල් වෙත ඔහුගේ මව සමඟ දුරකථනයෙන් කතා කිරීමට අවස්ථාව ලබාදුන් බවත් වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත. මියගිය සැකකරු අනෙක් රැඳවියන් සමඟ සුහදව කතාබස් කළ බවත්, ඔහුට කිසිදු රෝගාබාධයක් හෝ මානසික විකෘතිතාවක් නොතිබූ බවත් ඔවුන්ට නිරීක්ෂණය වී ඇත.

අලුයම 04.00 ට පමණ සැකකරු සිරමැදිරිය තුළ ගෙල වැළලාගෙන ඇති බව දැනගත් බවත්, ඒ වන විට සැකකරුවන් උපසේවා නිලධාරියාගේ භාරයේ සිටි බැවින් ඔවුන් ඒ පිළිබඳව කිසිවක් නොදන්නා බවත් සඳහන් කර ඇත. තමන් සිය රාජකාරිය නිසි ලෙස ඉටුකළ බවත්, මෙම සිද්ධියට කිසිදු සම්බන්ධතාවක් හෝ අනුබල දීමක් සිදුනොකළ බවත් දිවුරුම් ප්‍රකාශ මගින් සඳහන් කර ඇත.

**<u>පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව</u>**

2018.01.12 වන දින සිදු කරන ලද පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවට අනුව, මියගිය සුමුදු ලක්මාල් යන අයගේ වයස අවුරුදු 16ක් ලෙස සටහන් කර ඇත. මරණයට හේතුව ලෙස "ගෙල වැළලා ගැනීමෙන් සිදු වූ මරණයක්" [Hanging (Self-Suspension)] බව නිගමනය කර තිබේ.

***ශරීරයේ දක්නට ලැබුණු තුවාල (Injuries)***

1.බෙල්ල වටා සම්පූර්ණයෙන්ම විහිදුණු, සෙ.මී. 1.0ක් පළලැති, බෙල්ලේ ඉහළ කොටසේ ඇලයට පිහිටා තිබූ සලකුණකි. එය බෙල්ලේ දකුණු පසින් මදක් ඉහළට එසවී තිබුණි. බන්ධනයට යොදාගත් පටියේ රැහැන් වෙන් වී තිබීම හේතුවෙන් බෙල්ලේ දකුණු පසින් වෙන් වූ සලකුණු දෙකක් නිරීක්ෂණය විය. මෙම සලකුණ වම් පස කන් පෙත්තට සෙ.මී. 7ක් පහළින් ද, දකුණු පස කන් පෙත්තට සෙ.මී. 2ක් සහ සෙ.මී. 4ක් පහළින් ද පිහිටා තිබුණි. එහි ගැටයක සලකුණක් දක්නට නොලැබුණු නමුත්, බෙල්ලේ පිටුපස ඉහළ ප්‍රදේශයේ ප්‍රතිලෝම 'V' හැඩයක් ගන්නා පරිදි එය ඉහළට එසවී තිබුණි. මෙම සලකුණ බෙල්ලේ වම් පසින් වඩාත් ගැඹුරට විහිදී තිබුණි. ව්‍යවච්ඡේදනය කර පරීක්ෂා කිරීමේදී , සමට යටින් ඇති මේද පටකවල හෝ මාංශ පේශිවල කිසිදු තුවාලයක් නිරීක්ෂණය නොවූ අතර, තයිරොයිඩ් කාටිලේජයේ සහ හයොයිඩ් අස්ථියේ කිසිදු බිඳීමක් හෝ තුවාලයක් දක්නට නොලැබුණි. (A ligature mark, completely surrounding the neck, 1.0cm width obliquely placed on the upper part of the neck. It was raised slightly at the

right side of the neck. There were two separate marks on the right side of the neck due to separated strings of the ligature. It was 7cm below the ear lobe in left side and 2 and 4 cm below the ear lobe on right side. There was no knot mark but it was raised at the back making an inverted V mark at the back of the upper neck. It was deeper on the left side. On dissection upon there were no injuries seen in the sub cutaneous fat tissue or muscles. There were no injuries in the thyroid cartilage and the hyoid bone. )

2. වම් පාදයේ මැද කොටසේ ඉදිරිපස සිරස් අතට පිහිටා තිබූ, සෙ.මී. 8ක් දිගැති, කබොල බැඳුණු (Scabbed) රේඛීය පිරිමැදීම් තුවාලයකි. (A scabbed linear abrasion 8cm long vertically placed on the front of the left med leg).

3. වම් කලවයේ ඉදිරිපස පහළ ප්‍රදේශයේ ඇලයට පිහිටා තිබූ, සෙ.මී. 5ක් දිගැති, කබොල බැඳුණු රේඛීය පිරිමැදීම් තුවාලයකි. (A scabbed linear abrasion 5cm long obliquely placed over the lower front of the left thigh)

4. වම් පාදයේ ඉදිරිපස ප්‍රදේශයෙහි සුව වෙමින් පවතින තුවාල (Healing wounds) සමූහයක් නිරීක්ෂණය විය. ( There was a group of healing wounds on the front of the left leg)

*වැඩිදුර වෛද්‍ය නිරීක්ෂණ සහ අදහස්*

- පශ්චාත් මරණ පරීක්ෂණයෙන් හෙළිවන පරිදි, දේහයේ ගෙල වටා තිබූ බන්ධනය නිර්මාණය කර ඇත්තේ බැනියමක පහළ කොටසින් ඉරාගත් චක්‍රාකාර රෙදි කැබලි දෙකක් එකට අඹරවා අදිනහැර ගැටයකින් බැඳීමෙනි. (The autopsy revealed a body of a young boy with a ligature made from two circular pieces torn from the lower part of the west twisted together and put around the neck and tied with a running knot)

- ගෙලෙහි බන්ධන සලකුණක් පැවතිය ද, ඊට අනුරූපව මරණයට පෙර සිදු වූ මාංශපේශී තැලීම් හෝ හයොයිඩ් අස්ථියේ සහ තයිරොයිඩ් කාටිලේජයේ බිඳීම් නිරීක්ෂණය නොවේ. (There was ligature mark around the neck without any corresponding ante mortem muscle contusions or fractures of the hyoid bone and the thyroid cartilage)

- අවහිර වූ ශ්වසනය හේතුවෙන් ශරීරයට අවශ්‍ය ඔක්සිජන් නොලැබීමේ තත්ත්වය පිළිබඳ සාක්ෂි හමු විය.( There was evidence of asphyxia)

- බන්ධන සලකුණෙහි ස්වභාවය සහ අනෙකුත් පශ්චාත් මරණ පරීක්ෂණ ලක්ෂණ අනුව මෙය සියදිවි නසා ගැනීමක් (Self-suspension) බවට යෝජනා වේ. (The features of the ligature mark and other autopsy features are suggestive of a self-suspension)

- ශරීරයේ ප්‍රචණ්ඩකාරී තුවාල හෝ වධහිංසනයකට ලක් වූ බවට සනාථ කෙරෙන කිසිදු සාක්ෂියක් හමු නොවිය. (There was no evidence of injuries of violence or torture)

- විෂවේද විශ්ලේෂණයට (Toxicology analysis) අනුව, මියගිය තැනැත්තා මරණයට පෙර ගංජා, මධ්‍යසාර, වේදනානාශක හෝ වෙනත් ඇබ්බැහි වන මත්ද්‍රව්‍ය භාවිතා කර නොමැති බව තහවුරු විය.(Toxicology analysis revealed that deceased has NOT consumed Cannabis. alcohol or any sedative or addictive drugs prior to the death).

- මරණ පරීක්ෂණය අතරතුර ලබාගත් ඡායාරූප සුරක්ෂිතව පවතින අතර අධිකරණ ඉල්ලීමක් මත ඒවා ඉදිරිපත් කළ හැකිය. (Photographs taken during the autopsy are available and can be submitted to the courts at request.)

➢ **රජයේ රස පරීක්ෂක වාර්තාව පිළිබඳ විශ්ලේෂණය**

2018.10.17 දිනැති අංක S/1553/18 (CT/198/18) දරන රජයේ රස පරීක්ෂක වාර්තාවේ සඳහන් විශ්ලේෂණාත්මක නිගමන පහත පරිදි දක්වා ඇත.

- ලබාගත් රුධිර, මුත්‍රා සහ මුඛ කෝට සාම්පල පරීක්ෂා කිරීමේදී ඒ තුළ කංසා අඩංගු බවට අනාවරණය නොවීය. (Samples of blood, urine and mouth swabs did not reveal presence of cannabis)
- රුධිර සහ මුත්‍රා සාම්පල විශ්ලේෂණයේදී මධ්‍යසාර පවතින බවට තොරතුරු අනාවරණය නොවීය. (Samples of blood and urine did not reveal presence of alcohol).
- ලබාගත් රුධිර සහ පිත සාම්පල පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කිසිදු ද්‍රව්‍යයක් අඩංගු නොවන බව තහවුරු වියසැලිසිලේට් , බාර්බිටියුරේට් , බෙන්සෝඩියසපයින් , ෆීනෝතියසීන් වැනි ඖෂධ වර්ග.හෙරොයින් , මෝෆීන්, කෝඩීන් වැනි මත්ද්‍රව්‍ය.ඇම්ෆෙටමින් මෙතම්ෆෙටමින් සහ MDMA වැනි උත්තේජක මත්ද්‍රව්‍ය.( Samples of blood and bile did not reveal presence of salicylates, barbiturates, benzodiazepines, phenothiazines, heroin, morphine, codeine, amphetamine, methamphetamine, and MDMA)

**<u>නිරීක්ෂණ -</u>**

1. පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවට අනුව, මරණකරුගේ ගෙලෙහි බන්ධන සලකුණක් (Ligature mark) පැවති බවත්, මරණයට හේතුව ස්වයංව සිදුකරගත් ගෙල වැළලා ගැනීමක් (Self-suspension) බවත් සඳහන් කර ඇත. එම වාර්තාවට අනුව මරණකරුගේ ශරීරයේ පහරදීමක හෝ වධහිංසනයකට ලක් කිරීමක සලකුණු දක්නට නොලැබුණු බවත්, අභ්‍යන්තර ඉන්ද්‍රියයන්ට හෝ අස්ථි පද්ධතියට ප්‍රචණ්ඩකාරී හානි සිදුව නොමැති බවත් තහවුරු කර ඇත.

2. පැමිණිලිකාරිය විසින් විමර්ශන අවස්ථා වලදී ඉදිරිපත් කරන ලද කරුණු හා 2018.03.15 වන දිනැති ලිඛිත කරුණු දැක්වීම මෙන්ම, පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව අනුව වින්දිතයාගේ උපන් දිනය 2002.12.28 වන දින වේ. ඒ අනුව අනුව මියයන විට වින්දිතයාගේ සැබෑ වයස අවුරුදු 15 යි දින 13 කි. එහෙත් පොලිස් වාර්තාවල සහ මහේස්ත්‍රාත් අධිකරණ වාර්තාවල ඔහුගේ වයස අවුරුදු 17/18 ලෙස වැරදි සහගතව සටහන් කර තිබූ බව පෙනී යයි. පොලිස් දෙපාර්තමේන්තු නියෝග අංක ඒ20 හි 5(ඕ) වගන්තියට අනුව, බාලවයස්කාර රැඳවියන් කිසිදු හේතුවක් මත වැඩිහිටි රැඳවියන් සමඟ එකම සිරමැදිරියක රඳවා නොතැබිය යුතු අතර ඔවුන් සමඟ ඇසුරට ඉඩ නොදිය යුතුය. එසේ වුවද, 15 හැවිරිදි වින්දිතයා වයස අවුරුදු 28 සිට 60 දක්වා වූ වැඩිහිටි සැකකරුවන් හත්දෙනෙකු සමඟ රඳවා තැබීම මඟින් පොලිස් පටිපාටිය සහ ළමා ආරක්ෂණ නීති උල්ලංඝනය කර ඇති බව නිරීක්ෂණය වේ.

3. 2018.10.17 දිනැති අංක S/1553/18 (CT/198/18) දරන රජයේ රස පරීක්ෂක වාර්තාව අනුව පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ නිගමනයන්ට අනුව, මියගිය සුමුදු ලක්මාල් නැමැත්තා මරණයට පෙර කංසා (Cannabis), මධ්‍යසාර හෝ වෙනත් කිසිදු ඇබ්බැහි වන මත්ද්‍රව්‍යයක් භාවිතා කර නොමැති බව විද්‍යාත්මකව සනාථ වේ.

4. මෙම සිදුවීමට අදාළව පවත්වන ලද මූලික විමර්ශනයෙන් අනතුරුව, වැඩ බලන ස්ථානාධිපති, රාත්‍රී කාර්යභාර නිලධාරී, රාත්‍රී මෙහෙයුම් නිලධාරී සහ උපසේවා නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ පවත්වා ඇති බවත්, එහිදී නිකුත් කරන ලද විනය නියෝග ප්‍රකාරව අදාළ නිලධාරීන් වෙත ස්ථාන මාරුවීම් ලබා දී අවවාද කිරීමෙන් පසු එම විනය කටයුතු අවසන් කර ඇති බව, කොළඹ මධ්‍යම කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා විසින් 2025.05.28 දිනැති ලිපිය මඟින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත. තවද, වර්තමාන වන විට, අදාළ උපසේවා නිලධාරියා මේ වන විට පොලිස් සේවයෙන් විශ්‍රාම ලබා සිටින බවත්, සිද්ධිය වූ අවස්ථාවේ රාජකාරියේ නිරතව සිටි කාර්යභාර නිලධාරියා වෙනත් කරුණක් පදනම් කරගෙන පොලිස් සේවයෙන් පහ කර ඇති බවත් වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

5. මෙම සිදුවීම වාර්තා වූ කාලසීමාව තුළ පළමුවන වගඋත්තරකරු රාජකාරියේ නිරතව නොසිටි බව අනාවරණය වේ. තවද, මරණකරු අත්අඩංගුවට ගැනීමේ අවස්ථාවට සෘජුව සම්බන්ධ වූ දෙවන, හයවන, හත්වන සහ අටවන වගඋත්තරකරුවන් මෙන්ම, සැකකරු පොලිස් ස්ථානය වෙත භාර දීමෙන් අනතුරුව රාජකාරියේ නියුක්තව සිටි තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් ද, මරණකරුගේ සියදිවි නසාගැනීමේ ක්‍රියාව සඳහා සෘජුව වගකිව යුතු බව සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි අනාවරණය නොවේ. විශේෂයෙන්ම, පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව මඟින් මරණකරු වධහිංසාවට ලක්ව නොමැති බව තහවුරු වේ.

<u>නිගමනය -</u>

මෙම සිද්ධිය සම්බන්ධයෙන් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ (අංක 03) බී 87308/03/18 දරන අංකය යටතේ කරුණු වාර්තා කර ඇති අතර, 2018.01.12 වන දින පවත්වන ලද පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවට අනුව මෙම මරණය පොලිස් නිලධාරීන් විසින් සිදු කරන ලද වධහිංසා පැමිණවීමකින් හෝ සෘජු ශාරීරික පහරදීමකින් සිදු වූවක් බවට සාක්ෂි මඟින් සනාථ නොවේ. මරණයට සෘජු හේතුව ස්වයංව සිදුකරගත් ගෙල වැළලා ගැනීමක් (Self-suspension) බව වෛද්‍ය විද්‍යාත්මකව තහවුරු වන බැවින්, පැමිණිල්ලට අදාල ගොනුවේ කටයුතු මෙයින් අවසන් කරනු ලැබේ.

එසේ වුවද, මියගිය ජේ.ඒ. සුමුදු ලක්මාල් ජයසේකර නැමැත්තා ළමාවියේ පසුවන්නෙකු බව (මියයන විට වයස අවුරුදු 15 දින 13 කි) පැහැදිලිව පෙනී යාමට තිබියදීත්, ඔහුව වැඩිහිටි සැකකරුවන් හත්දෙනෙකු සමඟ එකම සිරමැදිරියක රඳවා තැබීම පොලිස් දෙපාර්තමේන්තු නියෝග අංක ඒ20 හි 5(ඩී) වගන්තිය උල්ලංඝනයකි. බාලවයස්කාර රැඳවියෙකුගේ ආරක්ෂාව තහවුරු කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම පැහැර හරිමින් සිදු කරන ලද මෙම ක්‍රියාව ඔහුගේ ආරක්ෂාවට සෘජු තර්ජනයක් වූවා සේම, සියදිවි හානිකර ගැනීමට පෙළඹෙන තත්ත්වයක් සිරමැදිරිය තුළ නිර්මාණය වීමට ද එය වක්‍රව හේතුවිය හැකි බවද නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම, උපසේවා නිලධාරියාට සෘජුව අධීක්ෂණය කළ හැකි පරිදි සිරමැදිරි ස්ථානගත කර නොතිබීම ද මෙහි දී අවධානයට යොමුවන කරුණුකි.

<u>නිර්දේශ</u>

1. ඉදිරියේදී මෙවැනි සිදුවීම් වැළැක්වීම සියලුම පොලිස් ස්ථානයන්හි අත්අඩංගුවේ පසුවන බාලවයස්කරුවන් සම්බන්ධයෙන් පොලිස් නියෝග අංක ඒ20 හි 5(ඩී) වගන්තිය දැඩිව ක්‍රියාත්මක කළ යුතුය. බාලවයස්කාර සැකකරුවන් කිසිදු හේතුවක් මත වැඩිහිටි රැඳවියන් සමඟ රඳවා නොතැබිය යුතු අතර, ඔවුන් සඳහා වෙන් වූ ආරක්ෂිත රැඳවුම් පහසුකම් ස්ථාපිත කිරීමට පොලිස්පතිවරයා කටයුතු කළ යුතුය.

2. රැඳවියන් රඳවා තබන සිරමැදිරි උපසේවා නිලධාරියාට සෘජුවම අධීක්ෂණය කළ හැකි පරිදි ස්ථානගත කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සියලුම පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කළ යුතු අතර, ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

3. සිරමැදිරි පද්ධති ආවරණය වන පරිදි සීසීටීවී (CCTV) කැමරා පද්ධති ශක්තිමත් කළ යුතු අතර ඒවා අඛණ්ඩව අධීක්ෂණය කළ යුතුය. පොලිස් භාරයේ පසුවන පුද්ගලයන් සම්බන්ධයෙන් සිදුවන ඕනෑම අනපේක්ෂිත සිදුවීමකදී අදාළ CCTV දර්ශන අනිවාර්යයෙන්ම විමර්ශන ආයතන වෙත ඉදිරිපත් කිරීමේ විධිමත් පටිපාටියක් ස්ථාපිත කළ යුතුය.

4. අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයන් සතු දේපළ සම්බන්ධයෙන් පොලිස් නියෝග 6(බී) ප්‍රකාරව නිසි පරිදි සටහන් තැබීම සහ අදාළ දේපළ සඳහා නිල කුවිතාන්සි නිකුත් කිරීම අනිවාර්ය කළ යුතුය.

5. පොලිසිය විසින් මාධ්‍ය වෙත තොරතුරු ලබාදීමේදී ඒවායේ නිරවද්‍යතාවය පිළිබඳව පූර්ණ වගකීම දැරිය යුතුය. විශේෂයෙන්ම අධිකරණ වෛද්‍ය වාර්තා නිකුත් වීමට පෙර පුද්ගලයන්ගේ චරිතයට හානි වන අන්දමේ පදනම් විරහිත හෝ සාවද්‍ය තොරතුරු ප්‍රචාරය කිරීම වැළැක්වීමට පියවර ගත යුතු අතර, එවැනි වරදක් සිදු කරන නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය.

6. බාලවයස්කාර රැඳවියන් හැසිරවීම, රැඳවියන්ගේ මානසික සෞඛ්‍ය ගැටලු හඳුනා ගැනීම සහ සියදිවි නසාගැනීම් වැළැක්වීමේ ක්‍රමවේදයන් සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් සඳහා විධිමත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

2026. 11. 12 දින පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මකවීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත -

1. අමාත්‍යතුමා,
ආරක්ෂක අමාත්‍යාංශය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ. - කරුණු දැන ගැනීම සඳහා

2. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 02. - නිර්දේශ ප්‍රකාරය සුදුසු පියවර ගැනීම සඳහා